

# සංක්‍රමණිකයකුගේ සටහන

## මාර්තු 8 වැනිදා -

ගැහැනියකට සම තැන් නාව මනුෂ්‍යයෙකු ලෙසද නොබියව අනතුරකින් තොරව මේ සමාජය තුල සිවිල් පුරවැසියෙකු ලෙසද දෙපයින් සිට ගැනීමට හැකි වාතාවරනයක් ගොඩ නගා ගැනීමට බාධාවක් වී ඇති සමාජ පසුගාමී මානසිකත්වයෙන් මිදී, සමාජය හා එහි ආකල්ප සුභවාදී පැත්තට වෙස් කර ගැනීම සඳහා තමන්ගේ හැකියාව, ශක්තිය ධෛර්ය හා දැනුවත්භාවය වර්ධනය කර ගන්නා දිනයක් බවට අප විසින් පත් කරගත් දිනය...............

## මාස්ටර් බ්ලාස්ටර්



ජයග්‍රහනය සඳහා පියවරු සියයක් සිටියත් පරාජය අවජාතකයි කියලා ලෙනින් කියපු කතාව ඔබනම් අහලා නැතුව ඇති. ඒත් ඒක සදාකාලික සත්‍යයක් බව පැහැදිලි වෙන්නේ මේ දිනවල කොදෙව් සංචාරයට එක්වීම පිනිස ඔබ දරනා වෑයමත් ඊට එරෙහිව මතුවී ඇති බලවේගත් දුටු විටයි. කන්ඩාමයක සාමූහික වගකීම කෙසේ වෙතත් තරඟ 400 කට අධික ප්‍රමානයක් අද්දැකීම් ඇත්තෙකු හා තරඟ 200 කට අඩු අද්දැකීම් ඇති සාමාජිකත්වයකින් හෙබි කන්ඩායමක තරඟ විලාශය, ප්‍රතිඵල වල වැඩි වගකීම නිතැතින්ම ඔබට හිමිවන බව ඔබද අවංකව පිලිගත යුතුයි. ඒ අනුව මේ මතු වී ඇති තත්වය විය යුතුම දෙයක් නොවේද ? සමහරවිට කවුරු හෝ බලධරකුගෙ ' බලපෑමෙන් ඔබ නැවත කන්ඩායමට එක්වේවි. ඒත් ඔබ වැනි විශිෂ්ඨ ගනයේ ක්‍රීඩකයෙකුට එය තරම්වේද කියා ඔබේම හදවතට කථා කොට බලන්න. ප්‍රිය සනත් සෑම වසන්තයකම අවසානයක් ඇති බව 38 හැවිරිදි ඔබට නොතේරෙන්නේ කවර නම් අභාග්‍යකටද ? අපේ පන්තියේ කොල්ලෙකු ලෙසින් මාතර වැල්ලෙන් ක්‍රිකට් දිවි ඇරඹූ ඔබ දශක දෙකකට ආසන්න කාලයක් ශ්‍රී ලංකාවට ගෙනා කීර්තිය හා සමානවම ඔබ ලැබූ ප්‍රසිද්ධිය, ජයග්‍රහන මෙන්ම ඔබ ලබා ගත් ආර්ථික සාර්ථකත්වය ඔබේ ක්‍රීඩා වාර්ථා ස ආපසු හැරී බැලීමෙන් පසු ඔබ විසින් ගෞරවනීය ලෙස තීරනයක් ගැනීමට කාලය එල්බ ඇතැයි ඔබ නොසිතන්නේද ? රැගෙන එන ලද කීර්තියද සමඟ ගෞරවනීය ලෙස ක්‍රීඩාවෙන් සමු නොගත් ජ්‍යේෂ්ඨ ක්‍රීඩකයන්ගේ අත්දැකීම් දැක ඇති අපි ඔබ එවන් තත්වයකට පත්වෙනු දකින්නට නොකැමැත්තෙමු. දයාබර සනත්, සාමාන්‍යයෙකු ලෙස ක්‍රීඩාවට එක් වූ ඔබ ක්‍රිකට් ක්‍රීඩාව උඩු යටිකුරු කල දැවැන්තයෙකු ලෙස නමක් තබා මහත්මයෙකු ලෙස ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරනු ඇතැයි අප බලාපොරොත්තු වන්නෙමු. ඔබ අපගෙ ' වීරයෙක් නොව සදාතනික මතකයක් වෙනුයේ ඉන් පසුවය.

## ක්‍රිකට් සහ මාධ්‍ය(සදා)චාරය -

කොමන්වෙලත් කුසලානෙට තරඟ කරපු අපේ ක්‍රිකට් කට්ටියගේ වැඩ බලන්න එක් රැස්වුන අපේ උදවිය ටීම් එකත් කට්ටියගෙ මච්චරුන් නිතරම මතක් කලේ දැඩි වේදනාවකින් මිසක් අහිතකින් නොවේ. කන්ඩායම තෝරපු, පුහුනු කටයුතු කරපු හැටි, තරඟවලට පෙර සූදානම් වීමේ ඉඳලා කන්ඩායමේ හැකියාවත්, ප්‍රතිවාදී කණ්ඩාම් වල ඒ වෙනුවෙන් ඇති කැපවීමත්, හැකියාවත් ගැන මනා අවබෝධයකින් සිටි අපිට මේ අවසන ප්‍රතිඵලය අරුමයක් නොවෙයි. ඒත් අර 96 මතකය නිතරම ඔළුවෙ ඇති නිසාත් ඉඳහිට නෙලන අදහාගත නොහැකි ප්‍රහාර නිසාත් යම් ප්‍රතිහාර්යක් වේදැයි අප බලාපොරොත්තු උනා. වුන දේ උනා. අපි බැන්නා බිව්වා එච්චරයි. දැන් ආපහු කොදෙව් සංචාරය දිහා බලාගෙන ඉන්නේ. ඒත් මේ සංචාරෙන් පස්සේ මෙහේ ඉන්න අපේ මාධ්‍ය ඇත්තෝ කණ්ඩායමේ චරිත සඝාතික හොයන්න ඉදිරිපත් වීම ගැන අපට දුකයි. මාධ්‍ය වලින් කටි කල යුත්තේ කණ්ඩායමේ ක්‍රීඩා විලාශය හා අඩුපාඩු මිසක් උන්ගේ පුද්ගලික වල්පල් ද ? කාටද ඒවා වැදගත් වෙන්නේ ක්‍රීඩකයන්ගේ ගෑනු ගැනත් උන්ගේ අනියම් සබඳතා ගැනත් ප්‍රසිද්ධියේ මාධ්‍ය වලින් කටි කිරීම අශික්කිත වැඩක්. කොයි මාධ්‍ය සදාචාරයටද ඒක වලංගු වෙන්නේ. ඔය කතන්දර වල සබෑ කථාව දැනගෙනද අපේ ඇත්තෝ ඕවා ගැන මාධ්‍ය ප්‍රචාර දෙන්නේ. තුවාන් මොහොමඩ්ලගේ මඩ නොදන්න පැත්තක ඉඳලා අපේ ඇත්තො බාල්දි වලින් වතුර ඇදපු ගැන අපට හරි කණගාටුයි. අසන්නන්ට ක්‍රීඩකයන්ගේ චරිත සඝාතික වැඩක් නැහැ. කරන්න ආපු වැඩෙයි වැදගත් වෙන්නේ ඒක ගැනයි කටි කල යුත්තේ. මිනිස්සු වේදනාවෙන් ඉන්න වේලාවක අනුන්ගේ කුනු අවුස්සලා සතුටු වෙන්නේ ඉතිං.........

## පිදෙල් කස්ත්‍රෝ -




කියුබාව කස්ත්‍රෝ, චේ, ගැන අප අනන්තවත් කියවා අසා දැන තිබුනත් කස්ත්‍රෝ සහෝදරයා ක්‍රියාකාරී දේශපාලනයෙන් විශ්‍රාම ගැනීම ගැන ඇමරිකාව ඇතුළු ලෝක බලවතුන් විසින් සඳහන් කරන පද "කියුබාව ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට පැමිනිමේ මුල් අදියර ඇරඹුනා." යන්න දැඩි හාස්‍යයට කරුනක් වුවත් ඒ ගැන යමක් ලිවීම වැදගත් යැයි සිතුනා. කස්ත්‍රෝ, චේ, රාහුල් ඇතුළු පිරිස "ග්‍රැන්මා" බෝට්ටුවෙන් කියුබාවට ගොඩ බැස්ස තැන සිට රාජ්‍ය බලය ලබා ගැනීම දක්වා වූ ඉතිහාස කතාව අදටත් ලෝක විප්ලවාදී ජනතාව විසින් ආශ්වාදයෙන් සමරන්නක් අඩසියවසක් පුරා බලවතුන්ගේ තර්ජන, ආක්‍රමන, පච ප්‍රචාර, ආර්ථික තහංචි, සම්බාදක මැද ඔහු ආ ගමන අනගිභවනීයයි. මෙහිදී ඔහු අප වැනි තුන්වැනි ලෝකයේ රටවලට වඩා වැදගත් වන්නේ ඔහුගෙන් අපට ලබා ගතහැකි ආදර්ශයන් නිසායි. විදේශ ප්‍රාග්ධන ආයොජනයන් විදේශ නය මත යැපෙන අපේ රටවල් වලට විදේශ ප්‍රාග්ධනය හා තාක්ෂණය තමන්ට අවශ්‍ය විට තමන්ගේ ප්‍රතිපත්ති හා රටේ ජනතාව උගස් කොට පාවා නොදී ගෞරවනීය ලෙස ඒවා ලබා ගන්නා ආකාරය ඔහු අපට පෙන්වා දුන්නේය. ඒ ස්ථිරසාර නිවැරදි ප්‍රතිපත්ති මත කරන රජයනට තමන්ගේ ප්‍රතිපත්ති වෙනුවෙන් කැපවීමටත්, නොසැලී සිටීමටත් හැකි නායකයන් ඇති රටක ලොව ඕනෑම බලවේග යන් ජයගත හැකි බව ප්‍රායෝගිකව ඔප්පු කර පෙන්වීමෙනි. තමනට සහය දුන් සමාජවාදි කඳවුර එකින් එක බිඳ වැටෙද්දී වුවද ලෝක බලවතාගේ මුව අද්දර රැඳී සිටිමින් ඔහුට අභියෝග කිරීමට හැකිවීමේ රහස නම් ඔහුගේ නොසැලෙන නායකත්වයයි. පෞර්ශවයයි. කියුබාව යනු ලොව පුරා වෙසෙන ප්‍රගතිශීලී සටන්කාමීන්ගේ විපලවාදී ආශ්වාදය-ආදර්ශය වන්නේද එනිසයි. අප ද මේ සටන්කාමී නායකයාට දිගාසිරි පතන්නෙමු. එසේම රාහුල් කස්ත්‍රෝටද ලෝකයාට හෙට දවසේ බොහෝ ආදර්ශයන් ලබා දීමට ශක්තිය හා ධෛර්ය ලැබේවායි පතමු.

## අප්‍රේල්

අරුණු රැල්ලක දැනෙයි තවමත්
සොයුර නුඹ හදවත මිනිස්කම
සැළෙණ මද නල තවම විසුලයි
අයුක්තිය පැරදූ නුඹේ හඬ
දැනුණි තවමත් දැනෙයි නිබඳව
පිදූ නුඹ දිවියේ අරුත් බව
පිපුණි එරබදු මලක් රහසින්
නුඹේ ලේ රතු පැහැය අරගෙන

සංක්‍රමණිකයා




සැඳෑ අඳුර හෙමින් හෙමින් ගලා එනවා. ඉර එළිය දවසේ මෙහෙවර නිමා කර සැතපෙන්නට සැරසෙද්දී අඳුර තමන්ගේ වැඩ කොටස බාර ගන්න යුහුසුළු වෙන හැටි හරිම අපූරුයි.. ඒ විතරක්යැ ගනඳුරට සහය දෙන්න වගේ මුළු වටපිටාවත් කලබලෙන් දවස නිමා කරන්න හදන හැටි එකම සිනමා සිත්තමක් වගෙයි.

මල් පොකුරු පළාතම සුවඳ කරලා විවේක ගන්න හදනවා. ඔන්න හෙන්දිරික්කා මල් ගහ, පිරෙන්නම දැන් මල් පිපිලා.. ගිනි රස්නෙ ටිකෙන් ටික අඩු වෙන බවක් දැනෙන්නට ගන්නවා.. කුරුල්ලෝ තමන්ගෙ කැදළි සොයා ගෙන පියාඹා එනවා.. හරියට ඉස්සර අපේ ගෙවල් වල උදේ රැකියා වලට ගිහින් සවසට ගෙදර එන තාත්තලා, අම්මලා, අයියලා, අක්කලා වගේ. ඒත් දැන් දැන් ඒක වෙනස් වෙලා තියෙන්නෙ හිත් වල පුදුම බියක් ඇති කරලා.. උදේ ගෙදරින් ගිය කෙනෙක් ආයෙ කොයි වෙලාවෙ ගෙදර එයි ද කියලා හිතා ගන්නවත් බැහැ. එයි ද නැද්ද කියන දෙගිඩියාවෙන් දවස ගෙවන්න සිද්ධ වෙලා ගෙදර ඉන්න අයට. ඒක මොන තරම් අමාරු දෙයක් ද කියලා තැන තැන බෝම්බ පුපුරවන අයටවත්, ඒවට සහය දෙන අයටවත් දැනෙන්නෙ නැති හැටි.

අපි යුද්ධය නවත්වන්න, නැත්නම් සාමය ඇති කරන්න ඕන කියන සංකල්පය තුළම තියෙන්නෙ සාමය අහිමි වීම පිළිබඳ කතාව. ඉතිං ඒ සාමය කාගෙන්ද අපි ඇති කරගන්න ඕන. අපි නිතර කියන ආකාරයට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදී සියල්ලන් අතර එකමුතුව රැක ගන්නට ඕන කියන සංකල්පය තුළම තියෙන්නෙත් අප අපව බෙදා දැක්වීමම නේද කියලත් හිතෙනවා. අපට අපි වෙන්න බැරි හැටි. අපට අපව නැති වෙලා ගිහින් කියලා අපට තාම නොතේරුණ නිසා අපව සොයා ගන්න ඕන කියලා දැනෙන්නෙත් නැහැ. අනෙකා ළඟ ඉන්න ඕන කියලා හිතෙන්නෙත් නැහැ.

ලෝකේ ගෝලාකාර බව සොයා ගෙන කොච්චර කල්ද? ඒත් දැන් දැන් හැමදේම ගෝලීයකරණය වෙලා කියලා කව්රු කව්රුත් කතා වෙනවා නිතර ඇහෙනවා. මේ බෝම්බ පිපිරෙන එකත් එහෙම එකක්වත්ද?

මිනිස් පුසුඹක් දැනී
හිතට කඳුලක් උනයි
ඒ කඳුළෙ උණුහුමට
සුසුම් වැල් හඬයි ..

මිනිස් පුසුඹක් දැනී
නොමිනිසුන් දුවයි
උන් සැඳුව මහ පොළොව
අනේ මියැදෙන්නට හදයි..

මිනිස් පුසුඹක් දැනී
අළුත් මල් පිපෙයි
එ මල් ලොව රැක ගන්ට
මනුස්සකම කොහෙන් ??

අනේ අර කුරුල්ලෝ කැදළි සොයා ගෙන පියාඹන ලස්සන. හිතට මොනතරම් සහනයක් ද ඒක, සතුටක්ද??